# ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය - අනුරාධපුර

පශ්චාත් උපාධි, බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය

## පශ්චාත් උපාධි පාඨමාලා සඳහා අයදුම්පත් කැඳවීම
## 2017/2018 අධ්‍යයන වර්ෂය

මෙම විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි, බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය මගින් ක්‍රියාත්මක පශ්චාත් උපාධි පාඨමාලා සඳහා 2017/2018 අධ්‍යයන වර්ෂයට සුදුසුකම් සපිරූ භික්ෂූන් වහන්සේලාගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මාධ්‍යය : සිංහල/ ඉංග්‍රීසි

විෂය ක්ෂේත්‍රයන් : පාලි, බෞද්ධ දර්ශනය, බෞද්ධ ශිෂ්ටාචාරය, සිංහල, සංස්කෘත, පුරාවිද්‍යාව, ඉතිහාසය, සමාජවිද්‍යාව, අධ්‍යාපන විද්‍යාව, දර්ශනය, මනෝවිද්‍යාව හා පුස්තකාල විද්‍යාව

### 1. ශාස්ත්‍රපති (සපර්යේෂණ) උපාධි පාඨමාලාව - Master of Art (Research) Degree Programme (MA)

පාඨමාලා කාලය : වසර 02

SLQF ස්තරය : Level 10 (Master Degree)

අවම සුදුසුකම් :

1. පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් ආයතනයකින් ඉහත විෂය ධාරාවන්ට අදාළව වසර 03කට නොඅඩු උපාධි පාඨමාලාවක් සමත්ව තිබීම

   හෝ

2. ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගමෙහි අවසාන පරීක්ෂණයෙන් සමත්ව තිබීම

   හෝ

3. ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ සනාතන සභාව විසින් පිළිගනු ලබන වෙනත් අදාළ සුදුසුකමක් සපුරා තිබීම.

පාඨමාලා ගාස්තුව : රු. 54,000/- (සමාන වාරික දෙකකින් ගෙවිය හැක)

**සටහන :** *මනෝවිද්‍යාව සහ පුස්තකාල විද්‍යාව යන විෂයයන් සඳහා පමණක් පාඨමාලා ගාස්තුව රු. 89,000/- කි. (මෙය සමාන වාරික 02 කින් ගෙවිය හැකිය.)*

### 2. දර්ශනපති උපාධි පාඨමාලාව - Master of Philosophy Degree Programme (MPhil)

පාඨමාලා කාලය : වසර 02

SLQF ස්තරය : Level 11 (Master of Philosophy Degree)

අවම සුදුසුකම් :

1. පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඉහත විෂය ධාරාවන්ට අදාළව ප්‍රථම පන්ති සාමර්ථ්‍යයක්/ දෙවන පෙළ (ඉහළ) පන්ති සාමර්ථ්‍යයක් සහිතව ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධියක් ලබා තිබීම
   හෝ
2. පිළිගත් විශ්වවිද්‍යාලයකින් ශාස්ත්‍රපති (සපර්යේෂණ/ දෑවුරුදු/ එක් අවුරුදු) උපාධියක් ලබා තිබීම
   හෝ
3. ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ සනාතන සභාව විසින් පිළිගනු ලබන වෙනත් අදාළ සුදුසුකමක් සපුරා තිබීම

පාඨමාලා ගාස්තුව : රු. 94,000/- (සමාන වාරික දෙකකින් ගෙවිය හැක)

**සටහන :** *මනෝවිද්‍යාව සහ පුස්තකාල විද්‍යාව යන විෂයයන් සඳහා පමණක් පාඨමාලා ගාස්තුව රු. 144,000/- කි. (මෙය සමාන වාරික 02 කින් ගෙවිය හැකිය.)*

### 3. දර්ශන විශාරද උපාධි පාඨමාලාව - Doctor of Philosophy Degree Programme (PhD)

පාඨමාලා කාලය : වසර 03

SLQF ස්තරය : Level 12 (Doctoral Degree)

අවම සුදුසුකම් :

1. පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඉහත විෂය ධාරාවන්ට අදාළව දර්ශනපති උපාධිය ලබා තිබීම
   හෝ
2. ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ සනාතන සභාව විසින් පිළිගනු ලබන වෙනත් අදාළ සුදුසුකමක් සපුරා තිබීම.

පාඨමාලා ගාස්තුව : රු. 144,000/- (සමාන වාරික දෙකකින් ගෙවිය හැක)

**සටහන :** *මනෝවිද්‍යාව සහ පුස්තකාල විද්‍යාව යන විෂයයන් සඳහා පමණක් පාඨමාලා ගාස්තුව රු. 194,000/- කි. (මෙය සමාන වාරික 02 කින් ගෙවිය හැකිය.)*

**අයදුම්පත් හා විස්තර පත්‍රිකා ලබා ගැනීම**

අයදුම්පත් හා විස්තර පත්‍රිකා ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි, බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයට කාර්යාල වේලාව තුළ පැමිණ හෝ විශ්වවිද්‍යාල වෙබ් අඩවියෙන් (www.busl.ac.lk) හෝ සහකාර ලේඛකාධිකාරි, පශ්චාත් උපාධි, බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර ලිපිනයට රු. 55.00ක මුද්දර ඇලවූ තම නම සහ ලිපිනය ලියන ලද සෙ.මී. 23×10 ප්‍රමාණයේ ලිපි කවරයක් එවීමෙන් හෝ ලබා ගත හැකිය. ඉල්ලුම්කරන පාඨමාලාව එහි සඳහන් කර එවිය යුතුය.

**අයදුම්පත් ගාස්තුව**

අයදුම්පත් ගාස්තුව **රු. 1000/-** කි. මෙම මුදල මහජන බැංකුවේ අංක **008-1001-7001-4461** දරන ගිණුමට හෝ සතියේ වැඩ කරන දිනවල පෙ.ව.9.00 සිට ප.ව.3.30 දක්වා විශ්වවිද්‍යාලයේ මුදල් අයකැමි කවුන්ටරය වෙත ගෙවිය හැකිය. (මේ සඳහා විශ්වවිද්‍යාලය විසින් නිකුත් කරන වවුචර් භාවිත කළ යුතුය)

**ලියාපදිංචි ගාස්තුව**

වාර්ෂික ලියාපදිංචි ගාස්තුව රු. 5000/- කි.

**අයදුම්පත් භාර දීම**

නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත පහත සඳහන් ලියකියවිලි සමග **සහකාර ලේඛකාධිකාරි, පශ්චාත් උපාධි, බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර** ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. එසේ නැතිනම් එම ලිපිනයට ගෙනවිත් භාර දිය යුතුය. අයදුම්පත බහාලන ලිපි කවරයේ වම්පස ඉහළ කෙලවරේ ඉල්ලුම්කරන පාඨමාලාවේ නම සඳහන් කළ යුතුය.

1. උප්පැන්න සහතිකයේ සහතික කළ ඡායා පිටපතක්
2. ජාතික හැඳුනුම්පතේ සහතික කළ ඡායා පිටපතක්
3. අධ්‍යාපන සහතිකවල සහතික කළ ඡායා පිටපත්
4. අයදුම්පත් ගාස්තු ගෙවූ ලදුපත

**පර්යේෂණ උපාධි පාඨමාලා සඳහා කාල නියමයකින් තොරව අයදුම්පත් භාර ගනු ලැබේ.**

වැඩි විස්තර - අධ්‍යක්ෂ, පශ්චාත් උපාධි, බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය (025-2235904)
විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවිය (www.busl.ac.lk)

ලේඛකාධිකාරි,
ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය,
අනුරාධපුර.